සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A, B** හා **C** යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ. **A කොටස** තුළ **පැරණි හා නව නිර්දේශය** ද **B කොටස** තුළ **පැරණි නිර්දේශය** ද **C කොටස** තුළ **නව නිර්දේශය** ද ආවරණය කරමින් ප්‍රශ්න ඇතුළත් කර ඇත.
* **A කොටසේ 1** සිට **25** දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* **B හෝ C කොටස්** අතුරෙන් **එක් කොටසක් පමණක්** තෝරාගෙන **26** සිට **50** දක්වා ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

## A කොටස

**1.** සන්නිවේදන ක්‍රියාවලියේදී 'බලපෑමෙහි' ඇති වැදගත්කම පෙන්වා දෙන ලද්දේ කවුද?
(1) විල්බර් ශ්‍රාම් (2) ශ්‍රාම් හා ඔස්ගුඩ්
(3) එඩ්වඩ් සැපීර් (4) ෂැනන් හා වීවර්
(5) හැරල්ඩ් ලැස්වෙල්

**2.** පණිවිඩයක ඇති කේත අර්ථකථනය කර අවබෝධ කර ගැනීම
(1) විකේතකරණයයි. (2) ආකේතකරණයයි. (3) පරිවර්තනයයි.
(4) වාර්තාකරණයයි. (5) ප්‍රතිපෝෂණයයි.

**3.** ජනමාධ්‍ය සන්දේශ හා ජනමත ප්‍රධානීන් අතර සම්බන්ධය පැහැදිලි කරන්නේ
(1) අත්දැකීම් පසුතලයෙනි. (2) සමාජානුයෝජනයෙනි.
(3) දොරටුපාල සංකල්පයෙනි. (4) දෙපියවර සංකල්පයෙනි.
(5) උත්තේජන ප්‍රතිචාර න්‍යායෙනි.

**4.** ජනමාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ග්‍රාහක භූමිකාව සක්‍රීය වේ. (2) සෘජු ප්‍රතිපෝෂණයක් ලබා දෙයි.
(3) සාක්ෂරතාව සම මට්ටමේ පවතී. (4) විෂම ජාතීය කණ්ඩායමක් වේ.
(5) පුළුල් වින්දන ක්ෂේත්‍රයක් නොමැත.

**5.** ව්‍යාජ අවශ්‍යතා පාරිභෝගික මනසෙහි ප්‍රතිස්ථාපනය කිරීමෙහි ලා වඩාත් දායකවන ප්‍රධාන ධාරාවේ මාධ්‍යය වන්නේ
(1) ගුවන්විදුලියයි. (2) සිනමාවයි. (3) රූපවාහිනියයි.
(4) අන්තර්ජාලයයි. (5) සමාජ මාධ්‍යයි.

**6.** 'නවෝත්පාදන විසරණය' නමැති සංවර්ධන සංකල්පය හඳුන්වා දුන් සමාජ විද්‍යාඥයාගේ නම කුමක් ද?
(1) විල්බර් ශ්‍රාම් (2) ඩඩ්ලි සියර්ස් (3) මහත්මා ගාන්ධි
(4) විමල් දිසානායක (5) එවරට් එම්. රොජර්ස්

**7.** සංවර්ධනයට අදාළව වර්ග කිරීමේදී දෙවන ලෝකයට ඇතුළත් කර ඇති රට කුමක් ද?
(1) කැනඩාව (2) ඕස්ට්‍රේලියාව (3) නවසීලන්තය
(4) සෝවියට් රුසියාව (5) එක්සත් රාජධානිය

[ දෙවැනි පිටුව බලන්න

**8.** රූප භාෂා සංඥාර්ථ ප්‍රබලව හා නිර්මාණශීලීව යොදා ගත හැකි මාධ්‍යය කුමක් ද?
(1) රූපවාහිනිය (2) පෝස්ටරය (3) සිනමාව
(4) ඡායාරූපය (5) චිත්‍රය

**9.** නිර්වාචික සන්නිවේදනය පිළිබඳ නිවැරදි අදහස කුමක් ද?
(1) ශරීර භාෂාවෙන් පමණක් සිදුවෙයි.
(2) සංඥා භාෂාව පමණක් යොදා ගනියි.
(3) ලේඛනය තුළ භාවිත නොවේ.
(4) ශරීර බසින් කියවෙන අර්ථ රටින් රටට වෙනස් විය හැකි ය.
(5) බෙර හඬ, සයිරන් නලා හඬ යනාදිය මෙයට අයත් නොවේ.

**10.** සංකේත යනු
(1) නර්තනයට අදාළ වූවකි.
(2) වාචික සන්නිවේදනය ඉක්මවූවකි.
(3) වෙනත් යමක් නියෝජනය කරන්නකි.
(4) ආගමික අදහස් ඉදිරිපත් කරන්නකි.
(5) ශබ්ද නොව රූප නියෝජනය කරන්නකි.

**11.** පුද්ගලාන්තර සන්නිවේදනය පිළිබඳ **සදොස්** ප්‍රකාශය තෝරන්න.
(1) මුහුණට මුහුණලා සිදු කළ හැකි ය.
(2) සෑම විටම තාක්ෂණය භාවිත කළ නොහැකි ය.
(3) නිර්වාචික සන්නිවේදනය මගින් වඩාත් ශක්තිමත් කළ හැකි ය.
(4) සමූහ සන්නිවේදනය තුළ සිදුවිය නොහැකි ය.
(5) භාවයන් වඩාත් තීව්‍ර ලෙස ප්‍රකාශයට පත් කළ හැකි ය.

**12.** කාර්යාල ප්‍රධානියා විසින් සේවකයින්ගේ දැනගැනීම සඳහා නිල නිවේදනයක් දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කරන ලදී. මෙහි දැක්වෙන සන්නිවේදන ස්වරූප මොනවා ද?
(1) විධිමත්, ලිඛිත හා දෘශ්‍ය (2) විධිමත්, අවාචික හා ලිඛිත
(3) අවාචික, දෘශ්‍ය හා අවිධිමත් (4) ලිඛිත, දෘශ්‍ය හා අවිධිමත්
(5) දෘශ්‍ය, අවාචික හා විධිමත්

**13.** 'ඔබට කීමට ඇති දේ ගොවියන්ට පැහැදිලිව කියන්න. එතකොට ඒ අය තේරුම් ගනීවි.' මෙම අදහසට ගැළපෙන සන්නිවේදන නිර්වචනයක් ඉදිරිපත් කළ විද්‍යාඥයා කවුද?
(1) චාල්ස් කූලි (2) විල්බර් ශ්‍රාම් (3) එඩ්වඩ් සැපීර්
(4) ක්ලෝඩ් ෂැනන් (5) හැරල්ඩ් ලැස්වෙල්

**14.** පාසල අලංකරණය සඳහා අරමුදල් රැස් කිරීමට සිසුන්ට අවශ්‍ය විය. ඒ සඳහා ස්ටිකරයක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් ඔවුහු සාකච්ඡා කළහ. මෙය අයත් වන සන්නිවේදන වර්ගය කුමක් ද?
(1) වාචික සන්නිවේදනය (2) සමූහ සන්නිවේදනය
(3) පුද්ගලාන්තර සන්නිවේදනය (4) කථන සන්නිවේදනය
(5) නිර්මාණාත්මක සන්නිවේදනය

**15.** ජන සන්නිවේදනයෙන් ඉටුකෙරෙන පහත සඳහන් කාර්යයන් අතර **අවම** වැදගත්කමක් ඇති කාර්යය කුමක් ද?
(1) විවිධ මතවාද ගොඩ නැංවීම
(2) සමාජානුයෝජනය සිදු කිරීම
(3) ග්‍රාහක අවශ්‍යතාවලට අනුකූල වීම
(4) සමාජ උරුමයන් පවරා දීම
(5) සමාජ සංවර්ධනය සඳහා පෙළඹවීම

**16.** **සදොස්** වාක්‍ය ඛණ්ඩය තෝරන්න.
මහජන සම්බන්ධතාව බොහෝ අවස්ථාවලදී
(1) ද්විපාර්ශ්වික ක්‍රියාවලියකි. (2) අලෙවිකරණ කාර්යයකි.
(3) කළමනාකරණ කාර්යයකි. (4) ප්‍රචාරණයෙන් වෙනස් වූවකි.
(5) දිගු කාලීන ප්‍රතිඵල අපේක්ෂා කරන්නකි.

**17.** ජනමාධ්‍ය ක්‍රියාවලිය තුළ බාහිර පාර්ශ්වයක මගපෙන්වීමකින් තොරව කටයුතු කිරීම
(1) වගවීමයි. (2) වගකීමයි. (3) ඇගයීමයි.
(4) ආචාරධර්මයි. (5) නියාමනයයි.

**18.** නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) සමූහ සන්නිවේදනය ද්විපාර්ශ්විකව පමණක් සිදුවේ.
(2) අන්තර්පුද්ගල සන්නිවේදනය ඒකමාර්ගිකව ද සිදු වේ.
(3) සංජානනය අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනයෙන් බැහැර වූවකි.
(4) සමූහ සන්නිවේදනය ග්‍රාහක සංඛ්‍යාව මත පමණක් පදනම් වේ.
(5) අන්තර්පුද්ගල සන්නිවේදනය ද්විපාර්ශ්විකව පමණක් සිදුවෙයි.

- අංක **19** සිට **21** දක්වා වූ ප්‍රශ්න සඳහා පහත තොරතුරු භාවිත කරන්න.
සන්නිවේදනය පිළිබඳ ආකෘති 3ක් පහත දැක්වේ.
*A* - හැරල්ඩ් ලැස්වෙල් ආකෘතිය
*B* - ෂැනන් සහ වීවර් ආකෘතිය
*C* - ශ්‍රාම් සහ ඔස්ගුඩ් ආකෘතිය

**19.** ආකේතකරණය සහ විකේතකරණය පිළිබඳ අවධානය යොමු කරන නමුත් රේඛීය ස්වභාවයක් පෙන්නුම් **නොකරන්නේ**
(1) *A* පමණි. (2) *A* හා *B* පමණි.
(3) *B* පමණි. (4) *B* හා *C* පමණි.
(5) *C* පමණි.

**20.** "මේ ටික දවසට වරුණි සෑහෙන්න මහත් වෙලානෙ. කණ්ණාඩිය නැතුව මට අඳුරගන්නත් බැරි වුණා." සන්නිවේදන මූලිකාංගවලට අදාළව මෙම තත්ත්වය පැහැදිලි කිරීමට වඩාත් යෝග්‍ය වන්නේ
(1) *A* පමණි. (2) *A* හා *B* පමණි.
(3) *B* පමණි. (4) *B* හා *C* පමණි.
(5) A, B හා *C* සියල්ලම ය.

**21.** "මුහුණපෑමට සිදුවිය හැකි සියලු යහපත් සහ අයහපත් තත්ත්වයන් පිළිබඳ සීතා ඉතා ගැඹුරින් සිතා බැලුවාය. මෙම තීරණයට එළැඹියේ ඒ සියල්ල පිළිබඳව සිදුකළ මනා තක්සේරුවකින් අනතුරුවය....".
ඉහත අවස්ථාව විවරණය කළ හැක්කේ
(1) *A* මගිනි. (2) *A* හා *B* මගිනි.
(3) *B* මගිනි. (4) *B* හා *C* මගිනි.
(5) *C* මගිනි.

**22.** ජනමාධ්‍ය මගින් ඉටුකරනු ලබන කාර්යයන් පිළිබඳ මූලික අවබෝධය ලැබීම අදාළ වන්නේ
(1) සුපරීක්ෂණයටයි. (2) සමාජානුයෝජනයටයි.
(3) විචාරශීලී චින්තනයටයි. (4) මාධ්‍ය සංස්කෘතියටයි.
(5) මාධ්‍ය සාක්ෂරතාවටයි.

**23.** ගැමි මාධ්‍ය සම්බන්ධ පහත ලක්ෂණ සලකන්න.
*A* - බොහෝවිට වාචික වේ.
*B* - නිශ්චිත අනන්‍යතාවක් පවතී.
*C* - එක් හැඩයකින් පමණක් යුක්ත වේ.
*D* - ඒ ඒ ප්‍රදේශවලට ආවේණික වේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ
(1) *A* හා *B* පමණි. (2) *A* හා *D* පමණි.
(3) *B* හා *C* පමණි. (4) *B* හා *D* පමණි.
(5) *C* හා *D* පමණි.

**24.** ආයතනයක බාහිර මහජන සම්බන්ධතා සඳහා ගැළපෙන මෙවලම් හා විධික්‍රම ඇතුළත් වරණය තෝරන්න.
(1) ප්‍රදර්ශන, ඡායාරූප, අනුග්‍රාහකත්වය, සෘජු ඇමතුම් අංක
(2) ප්‍රකාශන, ජංගම ප්‍රදර්ශන, පුවත් හසුන, දැන්වීම් පුවරුව
(3) සුබසාධක සමිති, ඡායාරූප, ප්‍රදර්ශන, සෘජු ඇමතුම් අංක
(4) පුවත් හසුන, දැන්වීම් පුවරුව, තිළිණ ලබා දීම, මාධ්‍ය සාකච්ඡා
(5) තරඟ සංවිධානය, සුබසාධක සමිති, ඡායාරූප, අනුග්‍රාහකත්වය

**25.** මාධ්‍ය අභිසාරිතාව පිළිබඳ විග්‍රහයේදී අදාළ **නොවන** වාක්‍ය ඛණ්ඩය කුමක් ද?
(1) මාධ්‍ය සමූහයක් කේන්ද්‍රගත වීම
(2) ඩිජිටල් අවකාශය තුළ වර්ධනයක් සිදුවීම
(3) පුරවැසි මාධ්‍ය අවස්ථා සංකෝචනය වීම
(4) සංදේශ ව්‍යාප්තියට පුළුල් අවකාශයක් නිර්මාණය වීම
(5) අන්තර්ජාල ව්‍යාප්තිය මගින් ජනමාධ්‍ය ප්‍රවර්ධනය වීම

## B කොටස

**26.** විවිධ තොරතුරු විශ්ලේෂණාත්මකව විවරණය කරමින් එය ග්‍රාහකයාට පැහැදිලි කිරීමේ ජනමාධ්‍ය කාර්යභාරය වන්නේ
(1) පෙළඹවීමයි. (2) අර්ථකථනයයි.
(3) සුපරීක්ෂණයයි. (4) සහසම්බන්ධතාවයි.
(5) සමාජානුයෝජනයයි.

**27.** ඥාන ගවේෂණයේදී භාවිත කරන ශිල්ප ක්‍රමයක් ලෙස සැලකෙන්නේ
(1) සහවේදනයයි. (2) සංකේන්ද්‍රනයයි.
(3) සංකේතනයයි. (4) සම්පර්කයයි.
(5) සම්පරීක්ෂාවයි.

**28.** නව ලිබරල්වාදය සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය කුමක්ද?
(1) ගෝලීයකරණයේ ප්‍රතිඵලයකි. (2) මාධ්‍ය මගින් හසුරුවයි.
(3) ජාතික ආර්ථිකයකට මග පාදයි. (4) බටහිර ආධිපත්‍යය ප්‍රචලිත කරයි.
(5) ව්‍යාපාරික ආධිපත්‍යය මගින් පාලනය වේ.

**29.** තරුණයෙක්, ''එක්තරා බීම වර්ගයක් නැතිව කෑම එපා'' බව පවසන වෙළඳ දැන්වීමක් රූපවාහිනියෙන් ප්‍රදර්ශනය කෙරුණි. මෙම දැන්වීම මගින් පිළිබිඹු වන සංස්කෘතික සාධකය වන්නේ
(1) සංස්කෘතික ලැග්මයි. (2) සංස්කෘතික කම්පනයයි.
(3) සංස්කෘතික හුවමාරුවයි. (4) ජනප්‍රිය සංස්කෘතියයි.
(5) සංස්කෘතික විසරණයයි.

**30.** පියල් පන්තිකාමරයේදී භාෂා උපාර්ජනය හා සම්බන්ධ අදහස් කිහිපයක් ප්‍රකාශ කළේය.
*A* - භාෂාව පරිහරණය කිරීමේ ශක්‍යතාවයි.
*B* - ජීව විද්‍යාත්මක පදනමකින් යුක්ත වේ.
*C* - සමාජ සංස්කෘතික පදනමකින් යුක්ත වේ.
*D* - උපත අනුව තීරණය වේ.

මෙයින් සත්‍ය වන්නේ
(1) *A* හා *C* පමණි. (2) *B* හා *C* පමණි.
(3) *A*, *B* හා *C* පමණි. (4) *A*, *B* හා *D* පමණි.
(5) *B*, *C* හා *D* පමණි.

**31.** සංදේශයක නිර්මාණශීලීත්වය මැනගත හැකි ප්‍රධාන ලක්ෂණයක් ලෙස සැලකිය හැක්කේ
(1) ප්‍රාසංගික බවයි. (2) සංකල්පයට ඇති හැකියාවයි.
(3) අපූර්වත්වයයි. (4) සුසංයෝගයට ඇති හැකියාවයි.
(5) පුද්ගල බද්ධතාවයි.

**32.** "අපේ අයියයි එයාගේ යාළුවොයි කතා කරන ඒවා කොච්චර අහගෙන හිටියත් මටයි, නංගිටයි තේරෙන්නේ නෑ. වචන තේරුණාට අර්ථය තමයි ප්‍රශ්නේ."
මෙම දරුවා ඉදිරිපත් කරන ව්‍යාකූලතාවට හේතුව වන්නේ
(1) උප සංස්කෘතියයි. (2) සමාජානුයෝජනයයි.
(3) විරෝධී සංස්කෘතියයි. (4) අත්දැකීම් පසුතලයයි.
(5) සංස්කෘතික සම්පර්කයයි.

**33.** පහත ප්‍රකාශ සලකා බලන්න.

*A* - තමා ඇසුරු කරන අයගේ භූමිකාව රඟ දක්වයි
*B* - පරමාදර්ශී චරිතවල ගති පැවතුම් තමාට ආරෝපණය කර ගනියි
*C* - කෙනෙකු ළඟින් ඇසුරු කරමින් සියලු ගති ලක්ෂණ පවරා ගනියි

ඉහත ප්‍රකාශවලට අනුරූප වන සමාජානුයෝජන ක්‍රම අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) භූමිකා නිරූපණය, අනුකරණය, තදාත්මීකරණය
(2) භූමිකා නිරූපණය, තදාත්මීකරණය, අනුකරණය
(3) තදාත්මීකරණය, අනුකරණය, භූමිකා නිරූපණය
(4) තදාත්මීකරණය, භූමිකා නිරූපණය, අනුකරණය
(5) අනුකරණය, භූමිකා නිරූපණය, තදාත්මීකරණය

**34.** ස්ව-සංකල්පය පිළිබඳ **සාවද්‍ය** අදහස තෝරන්න.

(1) කායික ස්වභාවය මත පදනම් වේ.
(2) සංවර්ධනය කර ගැනීමට හැකි ය.
(3) උත්පත්තියේදී පිහිටි දෙයක් නොවේ.
(4) තමා පිළිබඳ අනුන් හඳුනා ගන්නා ආකාරයයි.
(5) සමාජය තුළ අනන්‍යතාවක් ඇතිකර ගැනීමට බලපායි.

**35.** පහත සඳහන් ප්‍රකාශ සලකන්න.

*A* - 1: සංස්කෘතික හුවමාරුව 2: සැලසුම් සහගතව ද, සැලසුමකින් තොරව ද සිදු වේ.
*B* - 1: සංස්කෘතික ආක්‍රමණය 2: වෙළඳ අපේක්ෂාවෙන් තොර වේ.
*C* - 1: සංස්කෘතික කම්පනය 2: ස්වකීය සම්ප්‍රදාය යටපත් වීමේ ප්‍රතිඵලයකි.

ඉහත ප්‍රකාශ අතුරෙන් සෘජු සම්බන්ධතාවක් දක්වන යුගලය/ යුගල ඇතුළත් වරණය තෝරන්න.

(1) *A* පමණි.
(2) *A* හා *B* පමණි.
(3) *A* හා *C* පමණි.
(4) *B* පමණි.
(5) *B* හා *C* පමණි.

**36.** ඩඩ්ලි සියර්ස් දක්වන ලද ආකාරයට සංවර්ධනය සඳහා බලපාන ගැටලුවක් වන්නේ

(1) මන්දපෝෂණයයි.
(2) අවිශ්වාසයයි.
(3) යැපීම් මානසිකත්වයයි.
(4) ජාතික න්‍යායපත්‍රයක් නොමැතිවීමයි.
(5) සාක්ෂරතා ඥානයෙහි දුබලතාවයි.

**37.** භාෂාව පිළිබඳ වඩාත් නිවැරදි අදහස තෝරන්න.

(1) භාෂාව මිනිසාගේ මානව ක්‍රියාකාරකම් හසුරුවයි.
(2) භාෂාව වාර්ගිකත්වයේ සංකේතයක් නොවේ.
(3) භාෂා උපාර්ජනය ළදරුවියේදී පමණක් සිදුවෙයි.
(4) උපභාෂා නිසා ප්‍රධාන භාෂාව වෙනස් නොවෙයි.
(5) භාෂාව හා සංස්කෘතිය අතර දුරස්ථ සම්බන්ධතාවක් ඇත.

**38.** සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘති සැලැස්මකට අදාළ පියවර කිහිපයක් පහත දැක්වේ.

*A* *i*. තොරතුරු රැස්කිරීමේ ක්‍රම නිගමනය
*ii*. තොරතුරු විශ්ලේෂණය

*B* *i*. පූර්ව සාකච්ඡාව
*ii*. තොරතුරු රැස්කිරීමේ ක්‍රම නිගමනය

*C* *i*. තොරතුරු රැස්කිරීම
*ii*. තොරතුරු විශ්ලේෂණය

*D* *i*. පූර්ව සාකච්ඡාව
*ii*. මූලික නිගමනවලට එළඹීම.

මේ අතුරෙන් නිවැරදි අනුපිළිවෙළ දැක්වෙන යුගල ඇතුළත් වරණය වන්නේ

(1) *A* හා *B* ය.
(2) *A* හා *C* ය.
(3) *B* හා *C* ය.
(4) *B* හා *D* ය.
(5) *C* හා *D* ය.

**39.** ජන ක්‍රීඩාවල ලක්ෂණයක් වන්නේ
(1) අභිචාරාත්මක අර්ථ වියුක්ත වීමයි.
(2) විද්‍යාත්මක පදනමක් නොමැති වීමයි.
(3) විනෝදයට වඩා ආගමික සංකල්ප පැවතීමයි.
(4) දේව නමස්කාරයෙන් පමණක් ආරම්භ වීමයි.
(5) ආර්ථික සහ සාමාජයීය ජීවන රටාව නිරූපණය වීමයි.

**40.** මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දක්වා ඇත.
*A* - වර්තමානයේ ජන මාධ්‍ය මානව ජීවන රටාව හසුරුවයි.
*B* - මාධ්‍ය සංස්කෘතිය මගින් නව සමාජ අවශ්‍යතා නිර්මාණය කරයි.
ඉහත ප්‍රකාශ අතුරෙන්,
(1) *A* සත්‍ය වන අතර *B* අසත්‍ය වේ.
(2) *A* අසත්‍ය වන අතර *B* සත්‍ය වේ.
(3) *A* හා *B* යන දෙකම සත්‍ය වේ.
(4) *A* හා *B* සත්‍යවන අතර *A* මගින් *B* පිළිබඳව විස්තර කරයි.
(5) *A* හා *B* සත්‍යවන අතර *B* මගින් *A* පිළිබඳව විස්තර කරයි.

**41.** සංවර්ධන සන්නිවේදන ව්‍යාපෘතියක් පිළිබඳ පූර්ව සාකච්ඡාවක මූලික පරමාර්ථය වන්නේ
(1) ගැටලුව මනාව හඳුනා ගැනීමයි.
(2) පාරිසරික තත්ත්ව සොයා බැලීමයි.
(3) කාල රාමුව පිළිබඳ සාකච්ඡා කිරීමයි.
(4) දත්ත ලබාගත හැකි ක්‍රම විමර්ශනයයි.
(5) මූල්‍ය සම්පත් ලබා ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීමයි.

**42.** ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ පවත්නා ගැටලු දෙකක් පහත දැක්වේ.
- රටේ පොදු ප්‍රශ්නවලදී ජනමාධ්‍ය ආයතනවල එකමුතු බවක් නොමැතිවීම.
- ජනමාධ්‍ය වෙත පැවරී ඇති සමාජ වගකීම පිළිබඳ අනවබෝධය.

මෙබඳු ගැටලු උද්ගත වී ඇත්තේ,
(1) මාධ්‍ය ආචාරධර්ම පිළිබඳ අනවබෝධය නිසා ය.
(2) අධිපතිවාදී සන්නිවේදන සංකල්පයේ බලපෑම නිසා ය.
(3) ජනමාධ්‍යකරුවන්ට නිසි පුහුණුවක් නොලැබීම නිසා ය.
(4) ජනමාධ්‍ය සංස්කෘතිය ස්ථාපනය වී නොතිබීම නිසා ය.
(5) නිදහස් මාධ්‍ය සංකල්පය පිළිබඳ නොසැලකීම නිසා ය.

**43.** සිතෙහි අවුල් සහගත බව, පාලනය කරගත නොහැකි ලෙස සිතුවිලි හට ගැනීම හා එකම සිතුවිල්ල නැවත නැවත ඇතිවීමේ මානසික තත්ත්වය හඳුන්වන්නේ,
(1) ක්ලමතය ලෙස ය.
(2) වෛරය ලෙස ය.
(3) වික්ෂිප්තතාව ලෙස ය.
(4) ධ්‍රැවගතවීම ලෙස ය.
(5) අනාරක්ෂිත බව ලෙස ය.

- පහත වගුව ඇසුරෙන් **44** සහ **45** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| | X | Y |
|---|---|---|
| A | විචාරය | කලා නිර්මාණ රසවින්දනය |
| B | මාධ්‍ය සාක්ෂරතාව | විද්‍යුත් මාධ්‍ය ගෘහස්ථ ආක්‍රමණය |
| C | මාධ්‍ය සංස්කෘතිය | ගෝලීය පැවැත්ම |
| D | ජනප්‍රිය සංස්කෘතිය | සංස්කෘතික කම්පනය |

**44.** ඉහත වගුවෙහි X මගින් Y තීව්‍ර කරන්නේ
(1) A හිදී ය.
(2) B හිදී ය.
(3) A හා B හිදී ය.
(4) A, B හා C හිදී ය.
(5) A, C හා D හිදී ය.

**45.** ඉහත වගුවෙහි X මගින් Y අවම කරනු ලබන්නේ
(1) A හිදී ය.
(2) B හිදී ය.
(3) C හිදී ය.
(4) A, B හා C හිදී ය.
(5) B, C හා D හිදී ය.

**46.** සම්ප්‍රදායන් හා සම්මුතීන් බිඳ දැමීම කළ හැකි වුව ද, එය සිදුකළ යුත්තේ සමාජයේ යහපතට බව අවධාරණය කළ මාධ්‍ය විචාර ප්‍රවේශය කුමක් ද?
(1) සදාචාරාත්මක ප්‍රවේශය (2) භාෂාත්මක ප්‍රවේශය (3) ඓතිහාසික ප්‍රවේශය
(4) දේශපාලනික ප්‍රවේශය (5) සෞන්දර්යාත්මක ප්‍රවේශය

**47.** නිර්මාණ කාර්යයේදී ස්වීයත්වය යනු,
(1) තමා ලබන අත්දැකීම් ය.
(2) තම අනන්‍යතාව නිර්මාණ ඔස්සේ ඉදිරිපත් කිරීම ය.
(3) ග්‍රාහක ස්වරූපය හා අපේක්ෂා හඳුනා ගැනීම ය.
(4) නිර්මාණ ඉදිරිපත් කිරීම තමා විසින්ම සිදු කිරීම ය.
(5) ග්‍රාහක කේන්ද්‍රීය නිර්මාණ ඉදිරිපත් කිරීම ය.

**48.** ගැටුමකදී මැදිහත්කරුගේ කාර්යය වන්නේ
(1) ගැටුමට සෘජුව සම්බන්ධ වීමයි.
(2) දෙපාර්ශ්වයේ මත ගැටීමට අවස්ථාව සලසාදීමයි.
(3) දෙපාර්ශ්වය සමඟ වෙන් වෙන්ව සාකච්ඡා නොකිරීමයි.
(4) තුන්වන පාර්ශ්වයක් ලෙස කටයුතු නොකිරීමයි.
(5) ආරාධනාවකින් පමණක් ඉදිරිපත් වීමයි.

**49.** මාධ්‍ය හා භාෂා භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *A*. රූපවාහිනිය | - | 1. කාලයට වඩා අවකාශය ගැන සැලකිලිමත් වේ. |
| *B*. ගුවන්විදුලිය | - | 2. සංඛ්‍යා දත්ත බහුලව භාවිත නොකළ යුතු ය. |
| *C*. මුද්‍රිත මාධ්‍ය | - | 3. ඇතැම් විට ලේඛනය යොදා ගනී. |
| *D*. නව මාධ්‍ය | - | 4. සංක්ෂිප්ත යෙදුම් බහුලව භාවිත වේ. |

නිවැරදි සම්බන්ධතාව පෙන්නුම් කරන වරණය වන්නේ
(1) *A*1 , *B*2 , *C*3 , *D*4 (2) *A*2 , *B*3 , *C*1 , *D*4
(3) *A*3 , *B*2 , *C*1 , *D*4 (4) *A*2 , *B*1 , *C*4 , *D*3
(5) *A*3 , *B*2 , *C*4 , *D*1

**50.** රූපවාහිනී ආයතනයක ප්‍රවෘත්ති අංශය මෙබඳු ප්‍රතිපත්ති කිහිපයක් ලැයිස්තුගත කර තිබුණි.
*A* - රුධිරය දැක්වෙන රූප නොපෙන්වීම
*B* - විකලාංග සහිත මිනිස් රූප නොපෙන්වීම
*C* - සත්ත්ව හිංසන ප්‍රවෘත්ති ප්‍රතික්ෂේප කිරීම
*D* - මාංශ නිෂ්පාදන ප්‍රචාරණ දැන්වීම් ඇතුළත් නොකිරීම
ඉහත ප්‍රතිපත්ති හැඳින්වීමට වඩාත් යෝග්‍ය යෙදුම කුමක් ද?
(1) වාරණය (2) නෛතික බාධක (3) මාධ්‍ය නිදහස
(4) ස්වයං නියාමනය (5) ප්‍රේක්ෂක සුරක්ෂිතතාව

## C කොටස

**26.** 'ආගමික බැඳීම්වලින් තුන්වන ලෝකයේ විමුක්තිය ලබාගැනීම' යන සංවර්ධනය හා සම්බන්ධ සංකල්පය ඉදිරිපත් කරන ලද්දේ,
(1) එඩ්ගා ඕවන්ස් ය. (2) ශ්‍රීනිවාස් මෙල්කොට් ය.
(3) මහත්මා ගාන්ධි ය. (4) සිල්වියෝ වයිස්බෝඩ් ය.
(5) එවරට් රෝජර්ස් ය.

**27.** චිත්‍රපටයක් තිරගත කිරීමට පෙර අවසර ලබාගත යුතු ආයතනය කුමක් ද?
(1) චිත්‍රපට සංස්ථාව (2) ජනමාධ්‍ය අමාත්‍යාංශය
(3) රජයේ චිත්‍රපට අංශය (4) සංස්කෘතික අමාත්‍යාංශය
(5) ප්‍රසිද්ධ රැඟුම් පාලක මණ්ඩලය

**28.** මාධ්‍ය නියෝජිතයන් මැදිහත් වීමක් සහිත නීතිය මගින් ස්ථාපිත නියාමනය වන්නේ
(1) ස්වයං නියාමනයයි. (2) මාධ්‍ය නියාමනයයි.
(3) සහ නියාමනයයි. (4) අභ්‍යන්තරික නියාමනයයි.
(5) ව්‍යවස්ථාපිත නියාමනයයි.

**29.** ජනමාධ්‍ය මගින් ලබාදෙන තොරතුරු සියල්ල ජනතාව පිළිගන්නේ හෝ ප්‍රතික්ෂේප කරන්නේ හෝ මතක තබා ගන්නේ හෝ නැති බව ගුරුකුමීය පැහැදිලි කළා ය. මෙම තත්ත්වය HUB ආකෘතියට අනුව වඩාත් හොඳින් පැහැදිලි වන්නේ පහත කවර අංගය මගින් ද?

(1) නියාමනය (2) දොරටුපාලනය
(3) සේත්තකරණය (4) පෙරහනු
(5) මාධ්‍ය විස්තාරණය

**30.** පහත ප්‍රකාශ සලකන්න.

*A* - ඉලක්ක හඳුනාගනියි.
*B* - කාර්යය සැලසුම් කරයි.
*C* - කාර්යය සංවිධාන කරයි.
*D* - මාධ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් මෙහෙයවයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් සිද්ධි කළමනාකරුවකුගේ භූමිකාවට ඍජුව අදාළ වන්නේ

(1) *A* හා *B* පමණි. (2) *A*, *B* හා *C* පමණි. (3) *B* හා *C* පමණි.
(4) *B*, *C* හා *D* පමණි. (5) *C* හා *D* පමණි.

**31.** මාධ්‍ය ආයතන සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීමේදී අධිකරණ බලතල අර්ධ වශයෙන් හිමි වන්නේ කාටද?

(1) ප්‍රධාන කතුවරයාට (2) ඔම්බුඩ්ස්මන්වරයාට
(3) පුවත්පත් මණ්ඩලයට (4) පුවත් නිසි බලධරයාට
(5) පුවත්පත් පැමිණිලි කොමිසමට

**32.** සමීක්ෂණයකදී සමස්ත ජනගහනය නියෝජනය වන පරිදි තෝරාගන්නා කුඩා කොටස හඳුන්වන්නේ

(1) මාතය ලෙසය. (2) දත්තය ලෙසය.
(3) මූලාශ්‍රය ලෙසය. (4) නියැදිය ලෙසය.
(5) මධ්‍යන්‍යය ලෙසය.

**33.** ග්‍රැහැම් වොලස් දක්වන ආකාරයට නිර්මාණාත්මක චින්තන ක්‍රියාදාමයට අයත් අදියර වන්නේ

(1) සකස් කිරීම, පෝෂණය, ප්‍රදීපනය හා සත්‍යාපනයයි.
(2) සකස් කිරීම, පෝෂණය, සංවේදනය හා සත්‍යාපනයයි.
(3) කුතුහලය, සංවේදනය, සධූගමනය හා සම්බන්ධතාවයි.
(4) සකස් කිරීම, පෝෂණය, සම්බන්ධතාව හා සත්‍යාපනයයි.
(5) සකස් කිරීම, පෝෂණය, ප්‍රදීපනය හා සංවේදනයයි.

**34.** නිවස සුද්ධ-පවිත්‍ර කිරීමේ කාර්යය සඳහා උදව්වන ලෙස මව සිය පුතු නවීන්ගෙන් ඉල්ලා සිටියා ය. "දැන් නම් මට බැ. මේ මගේ ආසම කාටූන් එක බලන වෙලාව" රූපවාහිනිය නරඹමින් සිටි නවීන්ගේ පිළිතුර විය. එම පිළිතුරෙහි අන්තර්ගතය සමග ඍජුව සම්බන්ධ වන්නේ

(1) අපසරණයයි. (2) ප්‍රජානනයයි.
(3) සංජානනයයි. (4) නිශ්කර්ෂණයයි.
(5) සහසම්බන්ධයයි.

**35.** පෙර පාසලේ සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වාත් වැඩිහිටි අධ්‍යාපනය තුළත් මාධ්‍ය අධ්‍යාපන වැඩසටහන් ආරම්භ කළ යුතු බව සඳහන් ප්‍රකාශය කුමක් ද?

(1) ජිනීවා ප්‍රකාශය (2) පැරිස් ප්‍රකාශය
(3) ගෲන්වල්ඩ් ප්‍රකාශය (4) කොළඹ ප්‍රකාශය
(5) දිල්ලි ප්‍රකාශය

**36.** සමීක්ෂණ භාවිතයේ වාසියක් වන්නේ

(1) සැමවිටම සත්‍ය තොරතුරු රැස්කරගත හැකි වීමයි.
(2) අතීත සිදුවීම් පිළිබඳ තොරතුරු ලබාගත හැකි වීමයි.
(3) සංකීර්ණ ගැටලු සම්බන්ධයෙන් ද පුද්ගල අදහස් ලබාගත හැකි වීමයි.
(4) ප්‍රතිචාරකයින් සැමවිටම අපක්ෂපාතීව තොරතුරු සැපයීමයි.
(5) ප්‍රතිචාරකයින් විශාල ප්‍රමාණයකින් දත්ත ලබාගත හැකි වීමයි.

**37.** පාසල් අධ්‍යාපනය ඉලක්ක කරගනිමින් අධ්‍යාපනික වැඩසටහන් විකාශය කිරීම සඳහා ඒකාබද්ධ විශේෂ රූපවාහිනී හා ගුවන්විදුලි නාලිකා ද්විත්වයක් ආරම්භ කෙරිණි. මෙම ප්‍රවණතාව වන්නේ

(1) නිර්මහාපරිමාණකරණයයි.
(2) මාධ්‍ය අභිසාරිතාවයි.
(3) පරිභෝජ්‍යකරණයයි.
(4) වේගවත් සංදේශකරණයයි.
(5) නිර්නියාමනයයි.

**38.** ඔබ විසින් ගත් ඡායාරූපයක් අවසරයකින් තොරව වෙනත් පාර්ශ්වයක් විසින් පෞද්ගලික ප්‍රතිලාභයක් උදෙසා යොදාගන්නේ යැයි සිතන්න. මෙහිදී ඔබට සාධාරණය ඉටු කරගත හැක්කේ

(1) පුවත්පත් මණ්ඩල පනත මගිනි.
(2) තොරතුරු දැනගැනීමේ පනත මගිනි.
(3) බුද්ධිමය දේපළ පනත මගිනි.
(4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය මගිනි.
(5) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (1) (අ) වගන්තිය මගිනි.

**39.** තම විභාග ප්‍රතිඵල දැනගත් විගස සුරේෂ්ගේ නෙතට සතුටු කඳුළක් නැගුණි. චිත්‍රපටයකදී මෙවැනි අවස්ථාවක් රූගත කිරීම සඳහා වඩාත් යෝග්‍ය වන්නේ

(1) දුර රූපයයි.
(2) සමීප රූපයයි.
(3) මධ්‍ය සමීප රූපයයි.
(4) මධ්‍යම රූපයයි.
(5) අති සමීප රූපයයි.

**40.** පහත කරුණු සලකන්න.

*A* - කළමනාකරණ කාර්යයකි.

*B* - ආයතන ප්‍රතිරූපය වර්ධනය කිරීමේ කාර්යයකි.

ඉහත කරුණු අදාළ වන්නේ

(1) *A* මහජන සම්බන්ධතාවට ය. *B* සිද්ධි කළමනාකරණයට ය.
(2) *A* සිද්ධි කළමනාකරණයට ය. *B* මහජන සම්බන්ධතාවට ය.
(3) *A* හා *B* දෙකම මහජන සම්බන්ධතාවට ය.
(4) *A* හා *B* දෙකම සිද්ධි කළමනාකරණයට ය.
(5) *A* හා *B* දෙකම මහජන සම්බන්ධතාවට හා සිද්ධි කළමනාකරණයට යන දෙකටම ය.

**41.** යම් නිෂ්පාදනයක් අලෙවි කිරීමේදී ඒ සඳහා විශේෂ වට්ටමක් ලබාදෙන බවට මාධ්‍ය මගින් ප්‍රචාරණයක් සිදු කිරීම,

(1) ව්‍යාපාර මහජන සම්බන්ධතාවයි.
(2) රාජ්‍ය මහජන සම්බන්ධතාවයි.
(3) වෘත්තීය මහජන සම්බන්ධතාවයි.
(4) මාධ්‍ය මහජන සම්බන්ධතාවයි.
(5) ආයතනික මහජන සම්බන්ධතාවයි.

**42.** නිර්මාණාත්මක සන්නිවේදනය පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නිර්මාණයක් බිහි කිරීමේ හැකියාව පරිකල්පනයයි.
(2) අපූර්ව යමක් ගොඩනැගීමට ඇති හැකියාව සතතාභ්‍යාසයයි.
(3) මනසේ නව සිතුවිලි හා අදහස් නිපදවීමට ඇති හැකියාව ප්‍රතිභාවයි.
(4) පවත්නා අදහස් නැවත සකස් කිරීම නිර්මාණාත්මක චින්තනයයි.
(5) යම් කුසලතාවක් වර්ධනය කරගැනීම සඳහා නිරන්තර පුහුණු වීම ව්‍යුත්පත්තියයි.

**43.** චිත්‍රපටයක් ප්‍රදර්ශනය සඳහා **U** සහතිකයක් නිකුත් කිරීමෙන් අදහස් වන්නේ

(1) වැඩිහිටියන්ට වඩාත් සුදුසු බවයි.
(2) වැඩිහිටියන්ට පමණක් බවයි.
(3) අසීමාන්තික මහජන ප්‍රදර්ශනයට සුදුසු බවයි.
(4) වයස 18ට වැඩි ඕනෑම අයෙකුට නැරඹිය හැකි බවයි.
(5) වැඩිහිටියන් සමඟ පැමිණෙන වයස 18ට අඩු ළමුන්ට ද නැරඹිය හැකි බවයි.

- ප්‍රශ්න අංක **44** සහ **45** සඳහා පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

ඉගෙනුම් කාර්යය සඳහා පන්තියක ළමුන් සහභාගි වන ආකාරය පහත පරිදි වේ.

| | සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා |
|---|---|---|---|---|---|
| භෞතිකව | 05 | 12 | 16 | 12 | 10 |
| මාර්ගගතව | 15 | 08 | 04 | 08 | 10 |

**44.** සතිය තුළදී භෞතිකවත් මාර්ගගතවත් ඉගෙනුම් කාර්යය සඳහා සිසුන් සහභාගි වීමේ මධ්‍යන්‍ය අගයන් පිළිවෙළින්,
(1) 05, 04 (2) 55, 45 (3) 12, 08 (4) 16, 04 (5) 11, 09

**45.** සිසුන් භෞතිකවත් මාර්ගගතවත් පන්තියට සහභාගීවීමේ මාතය දැක්වෙන දින පිළිවෙළින්,
(1) සඳුදා හා බ්‍රහස්පතින්දා ය. (2) බදාදා හා සඳුදා ය.
(3) අඟහරුවාදා හා බදාදා ය. (4) අඟහරුවාදා හා සිකුරාදා ය.
(5) බදාදා හා සිකුරාදා ය.

**46.** විභාග ප්‍රතිඵල නිකුත් වූ සැනින් මීනා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියට පිවිස තම ප්‍රතිඵලය පරීක්ෂා කළාය. එහිදී ඇයට උපයෝගී වූ නව මාධ්‍ය ලක්ෂණ වන්නේ
(1) ජාලගතකරණය, වේගවත් සංදේශකරණය හා දත්ත සංචිතකරණයයි.
(2) අධිපාඨනීයත්වය, වේගවත් සංදේශකරණය හා දත්ත සංචිතකරණයයි.
(3) ජාලගතකරණය, අන්තර් ක්‍රියාකාරිත්වය හා අධිපාඨනීයත්වයයි.
(4) ස්වයංකරණය, අධිපාඨනීයත්වය හා ජාලගතකරණයයි.
(5) අන්තර් ක්‍රියාකාරිත්වය, ස්වයංකරණය හා වේගවත් සංදේශකරණයයි.

**47.** මාධ්‍ය සංදේශ තුළ ඇති වැදගත් කරුණු කෙටියෙන් හා පැහැදිලිව ග්‍රහණය කරගැනීම සඳහා විචාරශීලී ග්‍රාහකයකු සතු කුසලතාව,
(1) තක්සේරුකරණයි. (2) සංශ්ලේෂණයයි. (3) විශ්ලේෂණයයි.
(4) කාණ්ඩකරණයයි. (5) වියුක්තිකරණයයි.

**48.** සංස්කෘතිය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
*A* - මානව වර්ගයාගේ ඉතිහාසයේ සිට අද දක්වාම පවතී.
*B* - නොගැඹුරු, සරල සහ මහා පරිමාණ නිෂ්පාදන යන ලක්ෂණවලින් සමන්විතයි.
*C* - ජනතාවගේ ශ්‍රම ක්‍රියාකාරිත්වය සමඟ අවියෝජනීය සබඳතාවක් පවතී.
*D* - විඥාපන, දෘෂ්ටිවාදී, නිර්මාණාත්මක හා සන්නිවේදනාත්මක සමාජ කාර්යයක් ඉටු කරයි.
ඉහත ප්‍රකාශවලට අදාළ සංස්කෘතික ප්‍රභේද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) සාම්ප්‍රදායික, ජන, ජනප්‍රිය හා මාධ්‍ය
(2) සාම්ප්‍රදායික, ජනප්‍රිය, ජන හා මාධ්‍ය
(3) ජන, සාම්ප්‍රදායික, මාධ්‍ය හා ජනප්‍රිය
(4) ජන, මාධ්‍ය, සාම්ප්‍රදායික හා ජනප්‍රිය
(5) මාධ්‍ය, සාම්ප්‍රදායික, ජනප්‍රිය හා ජන

**49.** පහත වගුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | X | | Y |
|---|---|---|---|
| 1 | සමාජ මාධ්‍ය | A | ව්‍යාපෘතිය කෙරෙහි අභිසාරිතාව හේතු වේ. |
| 2 | නව මාධ්‍ය | B | නිල පණිවිඩ බෙදාහැරීම සඳහා භාවිත වේ. |
| 3 | ලින්ක්ඩ්ඉන් (LinkedIn) | C | වෘත්තීය ජාලගතකරණය සඳහා භාවිත වේ. |
| 4 | ට්විටර් (Twitter) | D | නව මාධ්‍යවල දියුණු අවස්ථාවකි. |

ඉහත X හා Y අතර නිවැරදි ගැළපීම පෙන්නුම් කරන වරණය කුමක් ද?
(1) 1D, 2B, 3C, 4A (2) 1A, 2B, 3D, 4C
(3) 1D, 2A, 3C, 4B (4) 1B, 2C, 3A, 4D
(5) 1C, 2A, 3D, 4B

**50.** පුද්ගලයකුගේ පෝෂණය, සනීපාරක්ෂාව, ඉඳුම්-හිටුම් පහසුකම් සහ මානව හිමිකම් වැනි සාධක ඉටු කරගැනීම සඳහා සන්නිවේදනය යොදාගැනීම හඳුනාගත යුත්තේ

(1) ස්වයං නිර්ණය ලෙසයි.
(2) ප්‍රජා සහභාගිත්ව වර්ධනය ලෙසයි.
(3) සංවර්ධන සන්නිවේදන අපේක්ෂා ලෙසයි.
(4) අවශ්‍යතා කේන්ද්‍රීයත්වය ලෙසයි.
(5) පරිසර විද්‍යාත්මක සමබරතාව ලෙසයි.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

**NEW/OLD**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

**29 S II**

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **A** හා **B** යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත වේ.
* **A කොටස** ප්‍රශ්න **තුනකින්** ද **B කොටස** ප්‍රශ්න **අටකින්** ද සමන්විත වේ.
* **A කොටස පැරණි හා නව නිර්දේශය** යන දෙකම ඇසුරින් සකස් කර ඇත.
* **B කොටස** තුළ **4, 5, 6, 7** ප්‍රශ්න **පැරණි නිර්දේශයට** ද **8, 9, 10, 11** ප්‍රශ්න **නව නිර්දේශයට** ද අනුව සකස් කර ඇත.
* **A කොටසින්** ප්‍රශ්න **දෙකකට** හා **B කොටසින්** ඕනෑම ප්‍රශ්න **තුනක්** තෝරාගෙන ප්‍රශ්න **පහකට පමණක්** පිළිතුරු සැපයිය යුතුය.

## A කොටස

**1.** සන්නිවේදනය සමාජ ක්‍රියාවලියකි.

(i) පාසල තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන අවස්ථා **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) පුද්ගලාන්තර සන්නිවේදනයට අයත් ලක්ෂණ **හතරක්** නම් කර ඉන් **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ජනමාධ්‍ය හා සමාජ මාධ්‍ය අතර පවත්නා වෙනස්කම් **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ඔබ කැමති ජනමාධ්‍යයක් ඇසුරෙන් සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංග **හතරක්** නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

**2.** (i) ජනප්‍රිය සංස්කෘතියේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) මාධ්‍ය සාක්ෂරතාව අවශ්‍ය වන්නේ ඇයිදැයි හේතු **දෙකක්** දක්වමින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රාම්-ඔස්ගුඩ් ආකෘතියේ ඇතුළත් ප්‍රධාන කරුණු **තුනක්** වෙන වෙනම පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ඔබ පාසලේ නව පුස්තකාල ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. ඒ පිළිබඳව ප්‍රචාරණය සඳහා භාවිත කළ හැකි ජනශ්‍රැතිකාංග **හතරක්** නම් කර ඉන් **දෙකක්** අදාළ කාර්යය සඳහා යොදා ගතහැකි ආකාරය නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 16)

**3.** සන්නිවේදන ක්‍රියාවලිය හඳුනාගැනීම ග්‍රාහක කුසලතාවකි.

(i) ග්‍රාමීය සංවර්ධනය සඳහා යොදා ගතහැකි ගුවන්විදුලි වැඩසටහන් ආකෘති **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) වර්තමාන ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන වාරණ ක්‍රම **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය සංස්කෘතිය මගින් නිර්මාණය කරනු ලබන නව සමාජ අවශ්‍යතාවන්හි යහපත් හා අයහපත් බලපෑම් **දෙක** බැගින් වෙන වෙනම විස්තර කරන්න. (ලකුණු 12)

(iv) ආපදා අවස්ථාවකදී ජනමාධ්‍ය හැසිරවිය යුතු ආකාරය පහත කරුණු ඇසුරෙන් නිදසුන් සහිතව පහදන්න.

- තොරතුරු කාර්යය
- අධ්‍යාපන කාර්යය
- පෙළඹවීමේ කාර්යය
- සමාජ සංවිධාන කාර්යය

(ලකුණු 16)

[දෙවැනි පිටුව බලන්න

## B කොටස

**4.** භාෂාව හා ජනමාධ්‍ය අතර ඇත්තේ සමීප සම්බන්ධතාවකි.

(i) ජීව භාෂාවකට අයත් ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04)

(ii) මාධ්‍ය නිවේදනයක් සකස් කිරීමේදී අවධානයට ගත යුතු කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ප්‍රධාන භාෂා ධාරාවෙන් උපභාෂාවක් වෙන්කර හඳුනාගත හැකි ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) ඓතිහාසික මාධ්‍ය විචාර ප්‍රවේශයට අදාළ කරුණු **හතරක්** ටෙලිනාට්‍ය නිදසුන් කරගනිමින් පහදන්න. (ලකුණු 16)

**5.** විචාරශීලී චින්තනය හා සහජීවනය සමාජ සංවර්ධනයට වැදගත් වේ.

(i) මාධ්‍ය විචාරකයා සතු ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) මාධ්‍ය ප්‍රචණ්ඩත්වය ගෘහස්ථ සාමය කෙරෙහි බලපාන ආකාර **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) රූපවාහිනිය වෙත ග්‍රාහකයින් ආකර්ෂණය කර ගැනීමට මාධ්‍ය ප්‍රචණ්ඩත්වය යොදා ගන්නා වැඩසටහන් වර්ග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) සංවර්ධනය සම්බන්ධව එවරට් එම්. රොජර්ස් විසින් ඉදිරිපත් කළ පහත කරුණු සමකාලීන නිදසුන් ඇසුරෙන් විග්‍රහ කරන්න.

(a) නවෝත්පාදන විසරණය

(b) ජාතික න්‍යායපත්‍රය සකස් කිරීම (ලකුණු 16)

**6.** මාධ්‍ය සාක්ෂරතාව යනු විවිධ කුසලතා රැසක එකතුවකි.

(i) මාධ්‍ය අධ්‍යාපනය ලබාදීමේ අරමුණු **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) නිර්මාණශීලී රූපණය හා නිර්මාණශීලී කථනය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය සාක්ෂරතාව හා සම්බන්ධ කුසලතා **තුනක්** විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සංදේශයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 16)

**7.** සාම්ප්‍රදායික මාධ්‍ය මෙන්ම නව මාධ්‍ය භාවිතය පිළිබඳ අවබෝධය සභාගයේ දරුවන්ට ඉතා වැදගත් බව පාසලේ උත්සවයකට පැමිණි ප්‍රධාන ආරාධිතයා පැවසුවේ ය.

(i) ප්‍රාග් ඓතිහාසික යුගයෙහි සාම්ප්‍රදායික සන්නිවේදනයේදී භාවිත කර ඇති දෘශ්‍ය සංඥා **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) වාචික සන්නිවේදනයේ ලක්ෂණ **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සාම්ප්‍රදායික මාධ්‍යයන්හි පවත්නා සුවිශේෂතා **තුනක්** උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) නව මාධ්‍ය තුළ භාවිත භාෂාව මගින් දේශීය භාෂා අභියෝගයට ලක්වන ආකාරය පහත කරුණු ඇසුරින් උදාහරණ සහිතව විස්තර කරන්න.

- යෙදුම් කෙටි කිරීම
- මිශ්‍ර භාෂාව
- සාවද්‍ය ව්‍යවහාරය
- දේශීය භාෂාවක් ඉංග්‍රීසි අකුරුවලින් ලිවීම

(ලකුණු 16)

**8.** තමා නුදුරේදී පැවැත්වීමට සැලසුම් කර ඇති චිත්‍ර ප්‍රදර්ශනය පිළිබඳ පුවත්පතකට සම්මුඛ සාකච්ඡාවක් ලබා දෙමින් අශේන් කියා සිටියේ ප්‍රදර්ශනය සඳහා අනුග්‍රහයක් අපේක්ෂාවෙන් සිටින බවයි.

(i) ලියනාඩෝ ඩාවින්චි විසින් දක්වා ඇති නිර්මාණශීලීත්වයේ මූලිකාංග **හතරක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ආයතනයක් තම ප්‍රතිරූපය වර්ධනය කරගැනීමේදී ව්‍යාපාර මහජන සම්බන්ධතාවට අදාළව භාවිත කරන උපක්‍රම **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) චිත්‍ර ප්‍රදර්ශනය සඳහා සිද්ධි කළමනාකරුවෙක් යොදාගන්නේ නම්, එම අවස්ථාවට අදාළව ඔබ

**9.** ගෝලීය සංවර්ධන ගැටලු නව මානයක් ඔස්සේ අධ්‍යයනය කිරීමෙන් සන්නිවේදන ප්‍රවේශ වැඩිදියුණු කිරීමට අවස්ථාව උදාවෙයි.

(i) එක්සත් ජාතීන්ගේ සංවිධානය දක්වන අන්තර් සම්බන්ධිත සංවර්ධනය සඳහා වන සන්නිවේදන ප්‍රවේශ **දෙකක්** නම් කරන්න. (ලකුණු 04)

(ii) ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා සංවර්ධන ගැටලු හඳුනා ගැනීමේදී සමීක්ෂණ යොදාගැනීමේ වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 08)

(iii) සංවර්ධනය සඳහා වන සන්නිවේදන ව්‍යාපෘතියක් සඳහා අදාළ ජන කණ්ඩායම වෙත ගොස් සිදුකරන සමීක්ෂණයකදී පිළිපැදිය යුතු ආචාරධර්ම **තුනක්** නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සංවර්ධන ක්‍රියාවලියේදී සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදය යොදාගැනීමේ වැදගත්කම කරුණු **හතරක්** ඔස්සේ පැහැදිලි කරන්න. (ලකුණු 16)

**10.** (i) අග්නිදිග ආසියාවේ ප්‍රථම ගුවන්විදුලිය බිහි වූ රට හා දශකය නම් කරන්න. (ලකුණු 04)

(ii) සිනමා මාධ්‍යයේදී භාවිත වන පහත රූප රාමු යෝග්‍ය වන්නේ කවර අවස්ථාවන්හිදී ද යන්න පැහැදිලි කරන්න.

(a) මධ්‍යම රූපය

(b) දුර රූපය (ලකුණු 08)

(iii) අන්තර් සංස්කෘතික අවබෝධය ශක්තිමත් කර ගැනීම සඳහා සිනමා මාධ්‍යය භාවිත කළ හැකි ආකාරය ප්‍රධාන කරුණු **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 12)

(iv) සිනමා මාධ්‍යයේ නිර්මාණ සම්බන්ධයෙන් බුද්ධිමය දේපළ පනත වැදගත් වන අයුරු පහත සාධක ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(a) ආර්ථික අයිතිවාසිකම්

(b) සාධාරණ භාවිතය (ලකුණු 16)

**11.** මාධ්‍ය ක්ෂේත්‍රය තුළ කාලීනව ඇතිවන නව ප්‍රවණතා හේතුවෙන් ඊට අදාළ නියාමන හා ප්‍රතිපත්ති ද පුළුල් වී තිබේ.

(i) රටක මාධ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේදී අවධානය යොමු කළ යුතු සාධක **දෙකක්** ලියන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලාංකේය මාධ්‍ය ග්‍රාහක ක්ෂේත්‍රය ආශ්‍රිතව ඇති වී තිබෙන නව ප්‍රවණතා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 08)

(iii) මාධ්‍ය නියාමනය පිළිබඳ වගකීම දරන ආයතන **තුනක්** නම් කර ඒවායෙහි කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 12)

(iv) මාධ්‍ය ව්‍යවහාරය පදනම් කරගත් ප්‍රවණතා **හතරක්** නම් කර ඉන් **දෙකක්** පිළිබඳව උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 16)

***